**ගොවිජන සංවර්ධන අරමුදල - 2016**

**-----------------------------------------**

ගොවිජන සංවර්ධන අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 97(5) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි .

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**----------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

## 2.1 තත්ත්වාගණනය කළ මතය

---------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ගොවිජන සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

--------------------------------------------

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජලධාරා ඇල්බම් තොග ගිණුම හා ජලධාරා අත්පොත් තොග ගිණුම පිළිවෙලින් රු. 112,000 කින් හා රු. 773,760 කින් වැඩියෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගත් රු. 93,740 ක් වටිනා කාර්යාල උපකරණ, වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණු අතර වර්ෂයේ වියදමක් ලෙස ආදායමට එරෙහිව කපා හැර තිබුණි. ඒ හේතුවෙන් කාර්යාල උපකරණ ක්ෂය රු.9,374 කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

### 2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදලේ මුදල් ශේෂය හා භාණ්ඩාගාර පොත් අනුව මුදල් ශේෂය අතර 2008 වර්ෂයේ සිට පැවත එන රු. 651,798 ක වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ජපන් යෙන් ආධාර වැඩසටහන යටතේ බෙදා දුන් ට්‍රැක්ටර් සඳහා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව අයවී ඇති වාරික මුදල් අගය සංවර්ධන අංශයෙන් ඉදිරිපත් කර ඇති උපලේඛන අගයන් සමඟ සැසඳීමේදී රු. 93,750 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව අක්කරබදු ආදායම රු.26,136,708 ක් වුවද සංවර්ධන අංශයේ ප්‍රගති වාර්තාවට අනුව එය රු.22,101,511 ක් වූයෙන් රු.4,035,197 ක වෙනසක් විය.

(ඈ) අවසරපත්‍ර ගාස්තු ආදායම ලැබීම් වවුචර් පත්‍ර අනුව හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා සැසඳීමේදී රු.359,733 ක වෙනසක් විය.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1995 වර්ෂයේදී ගොවිජන සේවා මධ්‍යස්ථාන හා ගොවි සංවිධාන වෙත ලබා දී තිබුණු ට්‍රැක්ටර් ට්‍රේලර් සඳහා 2016 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිග වාරික මුදල රු1,445,025 ක් වූ අතර එය අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) වනාතවිල්ලුව පටකරෝපණ විද්‍යාගාරය ඉදිකිරීම සඳහා 2012 වර්ෂයේ දී අරමුදල විසින් නැවත අයකර ගැනීමේ පදනම මත ලබා දී තිබුණු රු.543,000 ක අත්තිකාරම් මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ජපන් යෙන් ආධාර වැඩසටහන යටතේ කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් බෙදාදුන් ට්‍රැක්ටර් සහ ජල පොම්ප සඳහා වාරික අයකර ගැනීම ඉතා මන්දගාමී තත්ත්වයක පැවති අතර සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වාරික මුදල රු.388,184,868 ක් විය. මෙම හිඟ වාරික මුදල තුල ඇතුලත් දිස්ත්‍රික්ක 16 කට ලබා දී තිබූ රෝද 02 ට්‍රැක්ටර් 491 ක් හා දිස්ත්‍රික්ක 22 කට ලබා දී තිබූ රෝද 04 ට්‍රැක්ටර් 473 ක් සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට පිළිවෙලින් රු.11,663,259 ක් හා රු. 123,615,421ක් හිඟව තිබූ අතර සමාලෝචිත වර්ෂය තුලදී මෙම ට්‍රැක්ටර් සඳහා කිසිදු වාරිකයක් අයකර නොතිබුණි.

(ඈ) 2010 වර්ෂයේදී දිස්ත්‍රික්ක 03 ක ගොවීන් හා ගොවි සංවිධාන වෙත ලබා දී තිබූ ජල පොම්ප 85 ක් සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට රු. 201,405 ක් හිඟව තිබුණ අතර සමාලෝචිත වර්ෂය තුලදී මෙම ජල පොම්ප සඳහා කිසිදු වාරිකයක් අයවී නොතිබුණි.

**2.4 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

---

2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ (ආ) වගන්තිය ප්‍රකාරව කාර්යය නිමකල වහාම ලබාගත් අත්තිකාරම් මුදල පියවියයුතු වුවද සමාලෝචිත වර්ෂයේ දී අවස්ථා 16 කදී ලබා දී තිබූ එකතුව රු.6,343,175 ක අත්තිකාරම් 2017 මාර්තු 31 දින වන විටත් පියවා නොතිබුණි.

**2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

---

වර්ෂ පහකට වඩා වැඩි කාලයක සිට ගිණුම්වල ජංගම බැරකම් ලෙස දක්වා තිබූ එකතුව රු. 10,746,805 ක් වූ ඉසින යන්ත්‍ර තැන්පත් ගිණුමේ හා බුල්ඩෝසර් සේවා තැන්පත් ගිණුමේ ශේෂ 2015 වර්ෂයේ ආදායමක් ලෙසත්, යතුරුපැදි වාරික තැන්පත් ගිණුමේ රු.1,214,466 ක ශේෂය සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙසත් කිසිදු අධිකාරී බලයකින් තොරව ගිණුම් ගතකර තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

---

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.54,228,626 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 30,368,913 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 23,859,713 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. අවසරපත්‍ර ගාස්තු රු.13,772,215 කින් වැඩිවීම සහ ට්‍රැක්ටර් හා ට්‍රේලර් ආදායම රු.17,159,610 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 97 වගන්තිය අනුව අරමුදලේ ප්‍රධාන අරමුණු ලෙස නව කෘෂිකාර්මික ප්‍රතිපත්ති බලාත්මක කිරීම, සැපයුම වැඩි දියුණු කිරීම සහ සංවර්ධනය කිරීම, ගොවිජන කේන්ද්‍රය පරිපාලනය කිරීම හා සංවර්ධනය කිරීම, මධ්‍යස්ථානවල ගොඩනැගිලි උපකරණ හා වාහන නඩත්තු කිරීම හා නිලධාරීන් පුහුණු කිරීම දක්වා තිබුණි.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අයවැය ඇස්තමේන්තුවට අනුව කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරින් පුහුණු කිරීම සඳහා රු. මිලියන 1 ක් ද ජල කළමනාකරණය පිළිබඳ ප්‍රකාශන සැකසීම සඳහා රු.මිලියන 0. 5ක් වෙන්කර තිබුණි. එම මුළු මුදල වූ රු. මිලියන 1.5 යොදාගෙන ගොවිජන නීතිය අත්පොත මුද්‍රණය කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ මැයි 26 දින ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් අනුමැතිය ලබා දී තිබූ අතර විගණිත දිනය වූ 2017 මැයි 29 දින වන විටත් එකී කාර්යය නිම කර නොතිබුණි.

(ආ) නිශ්චිතව නියම කරන ලද නෛතික විධිවිධාන සඳහන් වන කාර්ය පරිපාටියක් හෝ මාර්ගෝපදේශ සංග්‍රහයකින් තොරව සමාලෝචිත වර්ෂයේ කුඹුරු ඉඩම් නොවන බවට සහතික පත්‍ර 522 ක් හා කුඹුරු ඉඩම් කෘෂිකාර්මික වගා හැර වෙනත් කාර්යයන් සඳහා යොදවා ගැනීමට අවසර පත්‍ර 596 ක් ද නිකුත් කර තිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

2006 වර්ෂයට පෙර හඳුනාගෙන තිබුණු රු. 450,000 ක තොග ඌනතාවයට වගකිව යුතු නිලධාරින්ගෙන් එම අලාභ අයකර ගැනීමට කටයුතු නොකර දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශනවල එම මුදල තොග ඌනතාවය ලෙස දක්වා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැය ගත ආදායම් සහ වියදම්, තථ්‍ය ආදායම් සහ වියදම් සමඟ සැසඳීමේදී සියයට 27 සිට සියයට 774 දක්වා සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 5.2 ක්‍රියාකාරි සැලැස්ම

අරමුදලින් සිදුකරනු ලබන කාර්යයන් හඳුනාගෙන සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර ගොවිජන සේවා මධ්‍යස්ථාන අලෙවිසැල් සංවර්ධනය සහ අළුත්වැඩියා කටයුතු සඳහා රු.14,202,267 ක ප්‍රතිපාදන ලබාදී තිබුණි. එම ප්‍රතිපාදන වලින් ක්‍රියාත්මත කළ ව්‍යාපෘතිවල ප්‍රගතිය පිළිබඳ දෙපාර්තමේන්තුවේ නිසි අධීක්ෂණයක් සිදු කර නොතිබුණි.

6. **පද්ධති හා පාලනයන්**

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර කොමසාරිස් ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | හඳුනාගැනීමකින් තොරව ගිණුම් ශේෂයන් අරමුදලට බැර කිරීම. |
| (ආ) අයවැය පාලනය | අයවැයගත ආදායම් හා වියදම් සහ තත්‍ය ආදායම් හා වියදම් අතර විචලනයන් පැවතීම. |
| (ඇ) මූල්‍ය පාලනය | (i) 2008 වර්ෂයේ සිට පැවත එන භාණ්ඩාගාර පොත් අනුව ශේෂය සහ අරමුදලේ මුදල් ශේෂයේ වෙනස නිරවුල් නොකිරීම.<br>(ii) 1995 වර්ෂයේ සිට හිඟ ට්‍රැක්ටර් ණය වාරික අයකර නොගැනීම. |